# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2119/18 - 2019 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7(1) වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/15/2016/VE/235.
*මගේ යොමු අංකය*: WAR/LAN/ACQUS/A2/5-70.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 77 වද්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ අඹකුඹුර ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවට කෑගල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2018.08.27 දිනැතිව පිළයෙල කර ඇති අංක මු.පි.කැ. 3625 හි පහත විස්තර කරන ඉඩම් කොටස.

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: ඔරේන්ජ්ග්‍රෝ වත්ත (කණුකැටිය කොටස); ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0073.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් 2019.06.26 වැනි දින පෙ.ව. 10.00 ට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019 ජුනි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත්කුමාර තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල.

2019 අප්‍රේල් මස 16 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-44

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.